සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

# I කොටස

සැලකිය යුතුයි:

* I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
* අංක 1 -20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි තම අවධානය යොමු කිරීමට බලපෑ එක් හේතුවක් වූයේ,
(1) ලන්දේසින්ගේ වෙළඳ කටයුතු පාලනයට පහසු වීම නිසාය
(2) ඉන්දියාවේ වෙළඳ කටයුතු පාලනයට පහසුවීම නිසාය
(3) ප්‍රංශය සමග යුධ කටයුතු පහසුවෙන් කර ගැනීමටය
(4) ත්‍රිකුණාමල වරාය ප්‍රංශ ජාතිකයින්ගෙන් නිදහස් කර ගැනීමටය

(02) ක්‍රි.ව. 1796 ඥන් එන්ගල්බෙක් ආණ්ඩුකාරයා විසින් ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ පවරා දෙන ලද්දේ,
(1) ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමට ය.
(2) බ්‍රිතාන්‍යයේ රජුට ය.
(3) බතාවියානු සමූහාණ්ඩුවට ය.
(4) ලන්දේසි වෙළඳ සමාගමට ය.

(03) මියුරන් කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයක් දක්වෙන පිළිතුර කුමක්ද?
(1) අවුමිල්දාර්වරුන්ට මුහුදුබඩ ප්‍රදේශ පාලනය භාරදීම
(2) මදුරාසි පාලනය මුහුදුබඩ ප්‍රදේශ වල ක්‍රියාත්මක කිරීම
(3) දේශීය නිලධාරීන් ඉවත් කොට අවුමිල්දාර්වරු ලවා බදු එකතු කරගැනීම
(4) අවුමිල්දාර්වරු ඉවත් කොට දේශීය නිලධාරීන් ලවා බදු එකතු කර ගැනීම

(04) උඩරටට චරපුරුෂයන් යැවීමේදී ජෝන් ඩොයිලි අනුගමනය කළ ක්‍රියාමාර්ගය වූයේ මින් කුමක්ද?
(1) කාන්තාවන් සේ වෙස්ගන්වා යැවීම
(2) ශාස්ත්‍රකරුවන් හා හිඟන්නන් ලෙස වෙස්ගන්වා යැවීම
(3) භික්ෂූන් හා වෙළඳුන් වශයෙන් වෙස්ගන්වා යැවීම
(4) රැකියා සොයා යන කම්කරුවන් සේ යැවීම

(05) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය අපට ලබා දුන්නේ,
(1) බ්‍රිතාන්‍යයන් ය. (2) ඉන්දියානුවන් ය.
(3) පෘතුගීසීන් ය. (4) ලන්දේසීන් ය.

(06) කෝල්බෲක් යෝජනාවල වැදගත්ම දේශපාලන ප්‍රතිසංස්කරණය වන්නේ,
(1) නව නීති ක්‍රමයක් හා උසාවි පද්ධතියක් හඳුන්වා දීමයි
(2) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීමයි
(3) පළාත් දහසය පළාත් පහක් කිරීමයි
(4) අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීමයි

(07) විවිධ පුද්ගලයින් හා සංගම් සර්වජන ඡන්ද බලයට විරෝධය ප්‍රකාශ කළ නමුත් එයට පක්ෂව අදහස් ඉදිරිපත් කරන ලද්දේ,

(1) ඊ.ඩබ්. පෙරේරා ය. (2) ඒ.ඊ. ගුණසිංහ ය.

(3) උඩරට ජාතික සභාව ය. (4) ලංකා දමිළ සංගමය ය.

(08) බ්‍රිතාන්‍යයයන් වෙනත් යටත් විජිත වලට පෙර ශ්‍රී ලංකාව තුළ මුලින්ම ක්‍රියාත්මක කළ යෝජනාව කුමක්ද?

(1) විධායක කාරක සභා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

(2) පාලනය සඳහා ආණ්ඩුකාර වරයෙකු පත් කිරීම.

(3) යටත් විජිත භාරව ලේකම් වරයෙකු පත් කිරීම.

(4) ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කිරීම සඳහා කමිටු පත් කිරීම.

(09) ⋆ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය

⋆ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

⋆ අධිකරණ සේවා කොමිෂන් සභාව

ඉහත යෝජනා ප්‍රථම වරට ඉදිරිපත් කරන ලද්දේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින්ද?

(1) ඩොනමෝර් යෝජනා මගිනි

(2) මැනිං ඩෙවොන්ෂයර් යෝජනා මගිනි

(3) සෝල්බරි යෝජනා මගිනි

(4) මැකලම් යෝජනා මගිනි

◆ **පහත A - E දක්වා ඇති තොරතුරු ඇසුරින් 10 - 11 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - ලංකා ලෝකය පුවත්පත ආරම්භ කිරීම

B - බෞද්ධ කොඩිය නිර්මාණයට දායක වීම

C - සිංහල බෞද්ධයා පුවත්පත ආරම්භ කිරීම

D - පැල්මඩුල්ලේ ධර්ම සංගායනාව මෙහෙයවීම

E - මහාබෝධි මුද්‍රණාලය ආරම්භ කිරීම

(10) අනගාරික ධර්මපාල තුමාගේ කාර්යයන් ඇතුළත් පිළිතුර කුමක්ද?

(1) C හා D (2) D හා B (3) C හා E (4) A හා B

(11) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන්ගේ කාර්යයන් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) D හා E (2) A හා D (3) A හා B (4) C හා E

(12) ග්‍රාමීය සාමාන්‍ය ජනතාවට වඩා ඉක්මනින් උගත් ධනවත් නාගරිකයින් ක්‍රිස්තියානි ආගම වැළඳ ගැනීමට හේතුවූයේ මින් කුමන කරුණක්ද?

(1) ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා ගැනීමේ අවශ්‍යතාවය නිසාය

(2) බුදු දහමට වඩා ක්‍රිස්තියානි ආගම උසස් කොට සැලකූ නිසාය

(3) බලහත්කාරයෙන් ක්‍රිස්තියානි ආගමට බඳවා ගැනීම නිසාය

(4) රජයේ රැකියා හා ලාභ ප්‍රයෝජන ලබා ගැනීම සඳහාය

(13) හින්දු ආගමික පුනර්ජීවන ව්‍යාපාරයේ පුරෝගාමියා වූයේ,

(1) ආරුමුග නාවලර් තුමා ය. (2) පොන්නම්බලම් අරුණාචලම් මහතා ය.

(3) පොන්නම්බලම් රාමනාදන් මහතා ය. (4) එස්.ජේ.වී. චෙල්වනායගම් මහතා ය.

(14) පහත A හා B වශයෙන් දක්වා ඇති ගොඩනැගිලි දෙක නිවැරදිව නම්කර ඇති පිළිතුර තෝරන්න.

(1) පැරණි පාර්ලිමේන්තුව හා එක්සත් ජාතීන්ගේ මූලස්ථානය
(2) එක්සත්ජාතීන්ගේ මූලස්ථානය හා ශ්‍රේෂ්ඨාධිකරණය
(3) නිදහස් චතුරස්‍රය හා ශ්‍රේෂ්ඨාධිකරණය
(4) පැරණි පාර්ලිමේන්තුව හා නිදහස් චතුරස්‍රය

(15) A - ඩී.එස්. සේනානායක මහතා බ්‍රිතාන්‍යයන් සමග එකඟතා ගිවිසුම් තුනක් අත්සන් කරනු ලැබීය.
B - ලංකාවේ ප්‍රථම ආණ්ඩුකාරවරයා සෝල්බරි සාමි ය.
C - වාමාංශික ව්‍යාපාර පුළුල් වීමත් සමග අධිරාජ්‍ය විරෝධී ආකල්ප වර්ධනය විය.
D - බ්‍රිතාන්‍යයන් යටතේ වසර 200 ක් පමණ කාලයක් ශ්‍රී ලංකාව පාලනය විය.
ඉහත ප්‍රකාශ වලින් නිවැරදි තොරතුරු ඇතුළත් ප්‍රකාශ පෙන්වන පිළිතුර තෝරන්න.
(1) C හා B (2) A හා D (3) B හා D (4) A හා C

(16) සමානුපාතික නියෝජන ක්‍රමය ලංකාවට හඳුන්වා දෙන ලද්දේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ද?
(1) සෝල්බරි ව්‍යවස්ථාවෙනි (2) ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවෙනි
(3) දෙවන ජනරජ ව්‍යවස්ථාවෙනි (4) මැකලම් ප්‍රතිසංස්කරණ වලිනි

(17) පහත (අ) සහ (ආ) තීරු දෙක නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| 1. ආචාර්ය එන්.එම්. පෙරේරා මහතා | A. කුඹුරු පනත පැනවීමේ පුරෝගාමියා විය |
| 2. පිලිප් ගුණවර්ධන මහතා | B. තුන් වරක් අගමැති තනතුරට පත්විය |
| 3. ඩඩ්ලි සේනානායක මහතා | C. ප්‍රථම විපක්ෂ නායක වරයා වීම |
| 4. කොල්වින් ආර් ද සිල්වා මහතා | D. ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීමේ පුරෝගාමියා වීම |

(1) CABD (2) BACD (3) CBDA (4) ADBC

(18) දේශ ගවේශන කටයුතු සඳහා ප්‍රථමයෙන්ම යොමුවූ යුරෝපා ජාතීන් වන්නේ,
(1) පෘතුගීසින් හා ප්‍රංශ ජාතිකයන් ය (2) ඉංග්‍රීසින් හා පෘතුගීසින් ය
(3) ප්‍රංශයින් හා ලන්දේසීන් ය (4) පෘතුගීසින් හා ස්පාඤ්ඤ ජාතිකයින් ය

(19) විසිවන සියවස වනවිට ලොව ඉහළම නාවික ශක්තියක් පැවති රට කුමක්ද?
(1) පෘතුගාලය (2) ප්‍රංශය (3) බ්‍රිතාන්‍යය (4) ඇමරිකා එක්සත් ජනපදය

(20) දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝක සාමය උදෙසා පිහිටුවා ගත් සංවිධානය වන්නේ,
(1) ජාතීන්ගේ සංගමයයි. (2) එක්සත් ජාතීන්ගේ සංවිධානයයි.
(3) නොබැඳි ජාතීන්ගේ සංවිධානයයි. (4) වෝර්සෝ සංවිධානයයි.

II කොටස

* පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
* අනෙකුත් ප්‍රශ්න අතුරින් කැමති ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

---

(01) තෙවන වාරය අවසානයේ ඉතිහාසය විෂයය සඳහා කරන ලද පාසල පදනම් කරගත් ඇගයීම ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) ඇගයීම සඳහා සිදුකල ක්‍රියාකාරකම කුමක්ද? (ල.02)

(ii) ඒ සඳහා ඔබේ කණ්ඩායමට ලැබුණු අනු මාතෘකාව සඳහන් කරන්න. (ල.02)

(iii) ඇගයීම සඳහා යොදාගනු ලැබුවේ පෙළපොතේ කුමන පාඩම් මාතෘකාවද? (ල.02)

(iv) ඇගයීම සඳහා ඔබ කණ්ඩායමට ලැබුණු රටවල් දෙකක නම් ලියන්න. (ල.02)

(v) මේ සඳහා ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් සඳහන් කරන්න. (ල.04)

(vi) ඇගයීම නිමකල පසු එයින් ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ල.04)

(මුළු ලකුණු 16යි)

(02) (i) ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමුකළ යුරෝපා රටවල් දෙකක් නම් කරන්න. (ල.02)

(ii) ඉංග්‍රීසීන්ට උඩරට රාජ්‍ය යටත් කරගැනීමට අවශ්‍ය වූ හේතු දෙකක් සඳහන් කරන්න. (ල.04)

(iii) ක්‍රි.ව. 1818 ප්‍රථම නිදහස් අරගලයට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ල.05)

(03) (i) පහත A හා B හි සඳහන් වර්ෂ වල ක්‍රියාත්මක කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අනුපිළිවෙළින් නම් කරන්න. (ල.02)

A - 1833 B - 1910

(ii) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හතරක් සඳහන් කරන්න. (ල.04)

(iii) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වලින් ආණ්ඩුකාරවරයාට පැවරුන බලතල පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල.05)

(04) (i) ආගමික පුනරුද සමයේ පිරිවෙන් පිහිටුවීම සඳහා මූලික වූ භික්ෂූන් වහන්සේලා දෙදෙනෙකු නම් කරන්න. (ල.02)

(ii) පහත ABCD යටතේ දැක්වෙන සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයින්ගේ නම් අනුපිළිවෙළින් සඳහන් කරන්න. (ල.04)

A. අමද්‍යප ව්‍යාපාරය ආරම්භ කිරීමට නායකත්වය ගත් පුද්ගලයා

B. තරුණ බෞද්ධ සංගමය පිහිටුවීමට පුරෝගාමී වූ පුද්ගලයා

C. හින්දු ආගමික පුනර්ජීවනයේ ප්‍රමුඛයා

D. සිංහල මුස්ලිම් කෝලාහල සමයේ සිටි ආණ්ඩුකාරවරයා

(iii) මිෂනාරීන්ට එරෙහිව බෞද්ධ පුනරුදය සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ල.05)

(05) (i) බ්‍රිතාන්‍ය පාලන සමයේ දේශපාලන බලතල ලබා ගැනීම සඳහා ලාංකිකයින් ආරම්භ කළ සංවිධාන දෙකක් නම් කරන්න. (ල.02)

(ii) ලංකා ජාතික සංගමය පිළිබඳ පහත අසා ඇති තොරතුරුවලට පිළිතුරු සපයන්න.

A. ආරම්භ කළ වර්ෂය (ල.01)

B. ප්‍රථම සභාපතිවරයා (ල.01)

C. ආරම්භ කිරීමට බලපෑ හේතුව (ල.02)

(iii) අමද්‍යප ව්‍යාපාරය දේශීය සංස්කෘතිය රැක ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ල.05)

(06) (i) පහත සඳහන් පුද්ගලයින් විසින් පිහිටුවා ගත් දේශපාලන පක්ෂ අනුපිළිවෙළින් නම් කරන්න.

A. එස්.ජේ.වී. චෙල්වනායගම් මහතා

B. එන්.එම්. පෙරේරා මහතා (ල.02)

(ii) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අංග හතරක් සඳහන් කරන්න. (ල.04)

(iii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් ජනාධිපතිවරණය පිළිබඳ පහත තොරතුරු ලියන්න.

A. ප්‍රථම ජනාධිපතිවරණය පැවැත්වූ වර්ෂය

B. ජනාධිපතිවරණයේදී අනුගමනය කරන ක්‍රියා මාර්ග දෙකක් ලියන්න. (ල.05)

(07) (i) පළමු වන ලෝක මහා සංග්‍රාමයේදී යුරෝපයේ රටවල් ගොඩනගා ගත් පිල් දෙක නම් කරන්න. (ල.02)

(ii) පළමුවන ලෝක සංග්‍රාමයට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ල.04)

(iii) ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා බිහිවූ ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ල.05)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |

## ඉතිහාසය I

| | | | | |
|---|---|---|---|---|
| (1) 2 | (2) 1 | (3) 4 | (4) 3 | (5) 1 |
| (6) 2 | (7) 2 | (8) 1 | (9) 3 | (10) 3 |
| (11) 2 | (12) 4 | (13) 1 | (14) 3 | (15) 4 |
| (16) 3 | (17) 1 | (18) 4 | (19) 3 | (20) 2 |

(ලකුණු $2 \times 20 = 40$)

## ඉතිහාසය II

(01) (i) සිතියම් ලකුණු කිරීම

(ii) ★ 18 වන සියවසේ යටත් විජිත
★ 19 වන සියවසේ යටත් විජිත
★ 20 වන සියවසේ යටත් විජිත
(මින් එකක් ලියා ඇත්නම් ලකුණු දෙන්න)

(iii) අධිරාජ්‍ය ව්‍යාප්තිය

(iv) ලැබුණු අනුමාතෘකාවට අනුව රටවල් තිබිය යුතුයි

(v) ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න

(vi) ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න (ලකුණු 16 යි)

(02) (i) පෘතුගාලය, ඕලන්දය, බ්‍රිතාන්‍යය, ප්‍රංශය

(ii) ★ කඩවත් බදු ගෙවීමට සිදුවීම
★ කොළඹත් ත්‍රිකුණාමලයත් අතර සබඳතා අපහසු වීම
★ මුහුදු සබඳතා වලට විශාල මුදලක් වැය වීම
★ උඩරට හරහා මාර්ගය සෑදීමට අවසර නොදීම

(iii) ★ නිතර දෙවේලේ දකින රජකු නොවීම
★ බ්‍රිතාන්‍යයන් ගිවිසුම කඩ කිරීම
★ රදළයින්ගේ ආදායම් අඩුවීම
★ භික්ෂූන් හා ආගම නොසලකා හැරීම
★ උඩරට පාලනය ව්‍යාකූල වීම

(03) (i) A - කෝල්බෲක් B - 1910 මැල්කම්

(ii) ⋆ රාජ්‍ය මන්ත්‍රණ සභාව ⋆ විධායක කාරක සභා
⋆ සර්වජන ඡන්ද බලය ⋆ රාජ්‍ය නිලධාරීන් තිදෙනා
⋆ පළාත්බද නියෝජනය

(iii) ⋆ බ්‍රිතාන්‍ය කිරීටයේ නියෝජිතයා වීම
⋆ පනත් නීති බවට පත් වීමට අත්සන් තැබිය යුතු වීම
⋆ අණපනත් වලට අනුමැතිය නොදී රඳවා ගැනීමේ බලය

(04) (i) ⋆ වලානේ සිද්ධාර්ථ හිමි ⋆ හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
⋆ රත්මලානේ ධර්මාලෝක හිමි

(ii) A - ආතර් වී දියෙස් මහතා B - දොන් බාරොන් ජයතිලක
C - ආරුමුග නාවලර් තුමා D - රොබට් චාර්මස්

(iii) ⋆ පිරිවෙන් පිහිටුවීම ⋆ වාද විවාද පැවැත්වීම
⋆ පොත්පත් සඟරා මගින් බුදු දහම ප්‍රචාරය කිරීම

(05) (i) ⋆ හලාවත සංගමය ⋆ පහතරට වැවිලි කරුවන්ගේ සංගමය
⋆ ලංකා ප්‍රතිසංස්කරණ සංගමය

(ii) A - 1919
B - පොන්නම්බලම් අරුණාචලම් මහතා
C - සිංහල මුස්ලිම් කෝලාහල සමයේ ඉංග්‍රීසින් විසින් අමද්‍යප සාමාජිකයින් මර්දනය කිරීමට එරෙහිව එක්සත් වීම සඳහා.

(iii) ⋆ නගර ගම් සිසාරා සංචාරය කරමින් රැස්වීම් පැවැත්විය
⋆ මත්පැන් භාවිතයේ ආදීනව ජනතාවට දැනුවත් කිරීම
⋆ අමද්‍යප සංගමයේ ශාඛා විවිධ ප්‍රදේශ වල පිහිටුවීම
⋆ පුවත්පත් සඟරා මගින් බීමත් කමේ ආදීනව පෙන්වා දීම

(06) (i) A - ෆෙඩරල් පක්ෂය B - සමසමාජ පක්ෂය

(ii) ⋆ නාමික විධායක වූ ජනාධිපති ⋆ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය
⋆ ජාතික රාජ්‍ය සභාව ⋆ උසාවි පද්ධතිය

(iii) A - 1982
B - ශ්‍රී ලංකාවම එකම ඡන්ද කොට්ඨාශයක් වීම
ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් 50% කට වඩා ගත් පුද්ගලයා ජනාධිපති වීම

(07) (i) මිත්‍රපිල හා මධ්‍යම යුරෝපා පිල

(ii) ⋆ ප්‍රංශය හා ජර්මනිය වෛරයෙන් පසු වීම
⋆ බ්‍රිතාන්‍යයේ නාවික ශක්තිය
⋆ ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරු සර්බියාවේදී මරා දැමීම

(iii) ⋆ ප්‍රබල රටවල් ජාතීන්ගේ සංගමයේ සාමාජිකත්වය නොගැනීම
⋆ තීරණ ක්‍රියාත්මක කිරීමට නායකත්වයක් නොමැති වීම
⋆ හමුදාවක් නොවීම